රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/10
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: / Date: 2023.05.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**2011.08.01 දිනට MN4-2006(A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබා දී ඇති පළාත් රාජ්‍ය සේවයේ තනතුරක නිරතව සිටි හා පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2010(I) අනුව මධ්‍යම රාජ්‍ය සේවයේ තනතුරකට ස්ථාන මාරුවී තිබීම මත සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් සම්බන්ධව තොරතුරු කැඳවීම.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(III)හි විධිවිධාන අනුව MN4-2006(A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන උපාධිධාරී තනතුරක 2011.08.01 දිනට පළාත් රාජ්‍ය සේවයේ නිරතව සිටි හා පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2010(I) අනුව මධ්‍යම රජයේ සංවර්ධන නිලධාරී තනතුරකට ස්ථාන මාරු වී පැමිණ සේවයේ නිරතව සිටි නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට පළ කරන ලදුව සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 14වන ඡේදය ප්‍රකාරව 2011.08.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබීය.

02. 2011.08.01 දිනට පසු මධ්‍යම රජයේ සංවර්ධන නිලධාරී තනතුරකට ස්ථාන මාරු වී ඇති නිලධාරීන් ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය කිරීම ද මධ්‍යම රජයේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරෙට ස්ථාන මාරු වී රාජකාරී භාරගත් දින සිට ක්‍රියාත්මක විය යුතු වුවද ඇතැම් නිලධාරීන් 2011.08.01 දින සිට ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය කර ඇති බැවින්, එම නිලධාරීන්ගේ වෙත යොමු කර ඇති අන්තර්ග්‍රහණ ලිපි සංශෝධනය කර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020හි 06වන ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මධ්‍යම රජයේ තනතුරට ස්ථාන මාරු කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කළ යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/08-05/02/2022 හා 2023.03.14 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

03. එබැවින් දැනට ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ 2011.08.01 දිනට පළාත් රාජ්‍ය සේවයේ නිරතව සිට පසුව මධ්‍යම රජයේ තනතුරකට ස්ථාන මාරු වී ඇති 2011.08.01 දිනට ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරමින් නිකුත් කර ඇති ලිපි සංශෝධනය කිරීම පිණිස එම නිලධාරීන්ගේ තොරතුරු පහත ආකෘතිය අනුව සකස් කර 2023.07.30 දිනට පෙර මා වෙත ඉදිරිපත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

| අනු අංකය | නිලධාරියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් ලබා ඇති පළාත් සභාව | පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සිට මධ්‍යම රජයේ තනතුරකට ස්ථාන මාරු වූ දිනය | සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරමින් නිකුත් කර ඇති ලිපියේ අංකය (CS/DOS/A/................) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

එස්.ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්